# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1961/25 – 2016 අප්‍රේල් 06 වැනි බදාදා – 2016.04.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, වැඩබලන ඉඩම් අමාත්‍ය විජේසුන්දර මුදියන්සේලාගේ තිලකරත්න බණ්ඩාර ඒකනායක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අධිකාරිපත්තුව සුළු කොට්ඨාසයේ, මල්වාන ගමේ පිහිටි, ගම්ගහ දිස්ත්‍රික් මැනුම් අධිකාරි විසින් පිළියෙළ කරන ලද අංක ගම්/බිය/2014/100 හා 2015.02.16 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'A' සහ 'B' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0466ක් පමණ වන ඉඩම් කොටස් සඳහා මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – ඉලුක්ඕවිට – ප්‍රමාණය: හෙක්. 0.0423ක් පමණ**
උතුරට: ඒ. සී. එම්. හුසේන් සහ එම්. එම්. ඒ. ෆායිස් හිමිකම් කියන ඉලුක්ඕවිට, මාර්ගය (මා.සං.අ.) සහ කැබලි අක්ෂර B; නැගෙනහිරට: කැබලි අක්ෂර B සහ කේ. එන්. ජයරත්න හිමිකම් කියන ඉලුක්ඕවිට; දකුණට: කේ. එන්. ජයරත්න හිමිකම් කියන ඉලුක්ඕවිට සහ ඒ. සී. එම්. හුසේන් සහ එම්. එම්. ඒ. ෆායිස් හිමිකම් කියන ඉලුක්ඕවිට; බටහිරට: ඒ. සී. එම්. හුසේන් සහ එම්. එම්. ඒ. ෆායිස් හිමිකම් කියන ඉලුක්ඕවිට සහ මාර්ගය (මා.සං.අ.).

02. **කැබලි අක්ෂර 'B' – ඉලුක්ඕවිට – ප්‍රමාණය: හෙක්. 0.0043ක් පමණ**
උතුරට: මාර්ගය (මා.සං.අ.); නැගෙනහිරට: කේ. එන්. ජයරත්න හිමිකම් කියන ඉලුක්ඕවිට; දකුණට: කේ. එන්. ජයරත්න හිමිකම් කියන ඉලුක්ඕවිට සහ කැබලි අක්ෂර A; බටහිරට: කැබලි අක්ෂර A සහ මාර්ගය (මා.සං.අ.).

ටී. බී. ඒකනායක,
*ඉඩම් අමාත්‍ය (වැ.බ.).*

යොමු අංකය: LD/05/2005/PT/461.
2015 දෙසැම්බර් මස 07 වැනි දින,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

04 – 829